ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
----------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1. තත්ත්වාගණනය කළ මතය
---------------------------------

කොළඹදිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
--------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේ දී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගත සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ). ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයන් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ වන බව ප්‍රකාශ කල නොහැකි වීම.

(ආ). ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.6.1. ගිණුම්කරණ අඩුපාඩු
------------------------

(අ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය
-------------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i). | 2018 මූල්‍ය ප්‍රකාශයෙහි අත්තිකාරම් ගිණුමෙහි (ඒසීජ් - 5) කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.183,617,153 ක් හා භාණ්ඩාගාර පොත් අනුව 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.184,860,882 ක් වූයෙන් එහි රු.1,243,729 ක නොසැසඳු ශේෂයක් පවතින අතර ඉන් රු.1,150,694 එනම් සියයට 93 ක්ම 2013 දෙසැම්බර් 31 පෙර සිට සැසඳුම් නොකිරීම නිසා ඉදිරියට එන ශේෂයන් බවට නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව වෙනසට අදාල සැසඳුම් නොකල ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | කමිටුවක් මගින් ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව. |

(ආ) දේපළ පිරියත හා උපකරණ
------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ජංගම නොවන වත්කම් | මූල්‍ය ප්‍රකාශණවල ඉඩම් | 2017 දෙසැම්බර් 31 දිනට |

| | | | |
|---|---|---|---|
| | සංචලන වාර්තාවේ 2018 ජනවාරි 01 දින ආරම්භක ශේෂ ලෙස පිළිවෙලින් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.55,690,000 ක්ද, ඉදිකිරීම් වටිනාකම රු.387,481,57 ක්ද වැඩියෙන් දක්වා තිබුණි. | ගොඩනැගිලි හා ඉදිකිරීම්වල ආරම්භක ශේෂයන් නිවැරදිව දැක්විය යුතුය. | ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ ශේෂයන් භාණ්ඩාගාර මුද්‍රිත අනුව සකස්කර තිබුණු නමුත් සත්‍ය වශයෙන් භෞතිකව පවතින ශේෂයන් (පෙර වර්ෂවලදි මිලදී ගත්) CIGAS වැඩසටහනේ ඇතුලත් කිරීම නිසා ආරම්භක ශේෂ වැඩි වී ඇති බව. |
| (ii) | මූල්‍ය ප්‍රකාශනයන්හි ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ වාහනවල වටිනාකම ආරම්භක ශේෂය රු.12,604,786 ක් අඩුවෙන්ද, යන්ත්‍රෝපකරණ, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණවල වටිනාකම රු.111,482,443 ක් අඩුවෙන් ද සටහන් කර ඇති බවට නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශණවල වාහන, යන්ත්‍රෝපකරණ, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණවල ආරම්භක ශේෂයන් නිවැරදිව දැක්විය යුතුය. | CIGAS වැඩසටහන යටතේ ආරම්භක ශේෂයන් ඇතුලත් කිරීම වත්කම් වර්ගීකරණය කිරීමක් සහ මාරු පත්‍ර මගින් ස්ථාර වත්කම්වල සත්‍ය වටිනාකම ඇතුලත් කිරීම හේතුවෙන් වටිනාකම අඩු වී අති බව. |

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණ අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණ බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) බැරකම් පිළිබඳ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | මෙම ලේඛනය ඉදිරියේ දී සකස් කර පවත්වාගෙන යන බව. |
| (ii) වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුය. | මෙම ලේඛනය ඉදිරියේ දී සකස් කර පවත්වාගෙන යන බව. |

නොතිබුණි.

| | | |
|---|---|---|
| (iii) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය<br>------------------------------- | | |
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. | මෙම ලේඛනය ඉදිරියේ දී සකස් කර පවත්වාගෙන යන බව. |
| (iv) පුද්ගල පඩිනඩි ලේඛනය<br>---------------------------- | | |
| මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා තිබුණත් එය යාවත්කාලීන කර නොතිබුණි. | භාණ්ඩාගාර හා විගණන ආකෘති පරිදි පුද්ගල පඩිනඩි ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. | මෙම ලේඛනය ඉදිරියේදී යාවත්කාලීනව පවත්වා ගෙන යන බව. |
| (v) ඇප ලේඛනය<br>------------------ | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළියෙල කර ඇතත් එය යාවත්කාලිනව පවත්වා නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරින් පිළිබඳව ඇප ලේඛනයක් යාවත් කාලීනව පවත්වා ගත යුතුය. | මෙම ලේඛනය ඉදිරියේදී යාවත්කාලීනව පවත්වා ගෙන යන බව. |
| (vi) විගණන විමසුම් ලේඛනය<br>---------------------------- | | |
| මුදල් රෙගුලාසි 452(1) ප්‍රකාර විගණන විමසුම් ලේඛනයක් ඇතත් එය යාවත්කාලිනව පවත්වා නොතිබුණි. | විගණන විමසුම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගත යුතුය. | මෙම ලේඛනය ඉදිරියේදී යාවත්කාලීනව පවත්වා ගෙන යන බව. |
| (vii) ඉන්ධන ලේඛනය<br>---------------------- | | |
| මුදල් රෙගුලාසි 1647(ඇ) ප්‍රකාරව ඉන්ධන ලේඛනයත් යාවත් කාලීනව පවත්වා නොතිබුණි. | ඉන්ධන ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. | මෙම ලේඛනය ඉදිරියේදී යාවත්කාලීනව පවත්වා ගෙන යන බව. |
| (viii) පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය<br>---------------------------- | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා | මෙම ලේඛනය ඉදිරියේදී යාවත්කාලීනව පවත්වා ගෙන යන බව. |

| | |
|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛනය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ඇතත් එය යාවත්කාලීන කරනොතිබුණි. | ගත යුතුය. |

(ix) වාහන ලොග්පොත

---------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාර වාහන ලොග්පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීනව පවත්වා ගත යුතුය. | මෙම ලේඛන ඉදිරියේදී යාවත්කාලීනව පවත්වා ගෙන යන බව. |

(ඇ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කල යුතු සහතික වීම්

-----------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන් දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනය ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | විගණන පනතේ 38 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචනයන් සිදුකල බවට ප්‍රකාශ ඉදිරියේ දී විගණකාධිපති වෙතට ලබා දීමට කටයුතු කරන බව. |

නොතිබුණි.

(ඉ) නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වෙනි පරිච්ඡේදයේ 10 වගන්තිය | 340,420 | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට 2018 නොවැම්බර්, දෙසැම්බර් මාස සඳහා 1/20 දීමනාව ගෙවීම. | මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිළධාරීන්ට 1/20 දීමනාව නොගෙවිය යුතුය. | ස්වදේශ කටයුතු ලේකම්ගේ HA/F/01/ACCTS/001 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව ගෙවා ඇති බව. |
| II. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| ➢ 565 (2) (3) (4) | 7,207,674 | විධිමත් පරිදි තැන්පතු ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබීම. | තැන්පතු ගිණුම් විධිමත් පරිදි යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | ඉදිරියේදී අදාල තැන්පත් ගිණුම් විධිමත්ව පවත්වා ගෙන යන බව. |
| ➢ 565 (5) | - | මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශ ඊලඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. | මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේ දී එම මාසික සාරාංශ ප්‍රකාශ විගණකාධිපතිට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| ➢ 570 (අ) | 10,098,791 | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වර්ෂ 10 ක් කල් ඉකුත් වූ ඉඩම් තැන්පතු 21 ක් සම්බන්ධව කටයුතු නොකිරීම. | කල් ඉකුත් වූ ඉඩම් තැන්පතු වෙනුවෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | නඩු කටයුතු හේතුවෙන් මෙම ඉඩම් තැන්පත් සම්බන්ධ කටයුතු කිරීමට නොහැකි බව දක්වා ඇතත් එම පිළිතුරට අදාලව එකිනෙක තැන්පත් සම්බන්ධයෙන් පැහැදිලි විස්තර ඉදිරිපත් කර නොමැත. |
| III. 2016 දෙසැම්බර් 09 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 9 ක්, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 2 ක්, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 2 ක්, හා රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 2 ක්, දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දැවෙන ඉන්ධන ප්‍රමානය පිළිබඳව පරීක්ෂාවන් සිදු කල යුතුය. | ඉදිරියේ දී අදාල පරීක්ෂාවන් නිසි පරිදි සිදු කරන බව. |

(ඊ) වංචනික ස්වරූපය ගණුදෙනු

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගණුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ❖ මහරගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල 2014 දෙසැම්බර් 09 දින මිය ගිය ආධාර ලාභිනියකගේ වැඩිහිටි දීමනා කාඩ්පත උපයෝගී කර ගෙන 2018 මැයි මස දක්වා මාස 40 | අදාල පරීක්ෂණ සිදු කර මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේ දී අදාල පරීක්ෂණ සිදුකර මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. |

| | | |
|---|---|---|
| කදී රු.77,200 ක මුදලක් අයථා අයුරින් ලබා ගෙන තිබුණි. ඒ සඳහා නිසි පරීක්ෂණයක් කර නොතිබුණි. | | |
| ❖ මහරගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 525 A උඩහමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම්තුල වැඩිහිටියන් පස්දෙනෙකු සඳහා ඔවුන් මිය ගිය පසුව රු.330,200 ක මුදල් වංචනික ලෙස ලබාගෙන තිබුණි. මේ පිළිබඳව පරීක්ෂණයක් කර නොතිබුණි. | අදාල පරීක්ෂණ සිදු කර මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේ දී අදාල පරීක්ෂණ සිදුකර මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාසික අග්‍රිම සැලසුම් කිරීම, ඉල්ලුම් කිරීම සහ ලැබුණු අග්‍රිමය පිලිබද විශ්ලේෂණයේදී වර්ෂය තුල ඉල්ලුම් කල මුළු අග්‍රිමයට වඩා වර්ෂය තුල ලැබුණු මුළු අග්‍රිමය රු. මිලියන 25 ක් අඩුවෙන් ලබා දී තිබුණි. | නිසි පරිදි අග්‍රිම සැලසුම් කර අදාල අග්‍රිම මුදල් ලබා ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී විධිමත් පරිදි කටයුතු කරන බව. |

### 2.2 වියදම් කළමනාකරණය
----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ ඇස්තමේන්තු කරනු ලැබූ ප්‍රතිපාදනයන්ට අමතරව වැය විෂයයන් 18 ක් සඳහා රු.210,487,900 ක එකතු කිරීම් ද, වැය විෂයයන් 18 ක් සඳහා රු.210,487,900 ක අඩු කිරීම් ද තිබීම | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන අනුව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාලනයෙන් තොර සිදුවන කාර්යයන් නිසා මෙවැනි තත්වයන් ඇති වී ඇති බව. |

| | | |
|---|---|---|
| හේතුවෙන් ඇස්තමේන්තු සැකසීම නිරවද්‍යතාවයකින් යුතුව සිදු වී නොතිබුණි. | | |
| (ආ) වැය විෂය අංක 255-1-1-1002 සහ 255-1-1-1201 අදාලව එකතුවීම් ප්‍රතිශතය පිළිවෙලින් සියයට 103 සහ 99 බවට නිරීක්ෂණය වූ අතර මූලික ඇස්තමේන්තුව හා ශුද්ධ ප්‍රතිපාදනය අතර දැඩි විචලනයන් පවතින බවට නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන අනුව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. | විශේෂිත කාරනා මත සේවකයින් යෙදවීමට සිදුවීම, ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් භාණ්ඩාගාරයෙන් ලැබීම, අතිරේක ප්‍රතිපාදන කිසිවක් ලබා නොගෙන වියදම් කලමනාකරනය කිරීම පදනම් කර ගනිමින් ප්‍රතිපාදන මාරු කරන ලද බව. |
| (ඇ) 255-1-1-2401-7 හි මුළු ඇස්තමේන්තුගත මුදලම එනම් සියයට සියයක්ම මුදල් රෙගුලාසි 66 හා 69 අනුව වෙනත් වැය විෂයන්ට මාරුකර ඇති බවට නිරීක්ෂණය වූ අතර විෂය අංක 255-1-1-1301 න් අඩුකල මුදල ප්‍රතිශතාත්මකව සියයට 72 බවට නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50හි විධිවිධාන ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. | හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් වෙනුවෙන් ලද මුදල් හා වාහන නඩත්තු වියදම් පැණනොනැගුණු නිසා මාරු කල බව. |
| (ඈ).වැය විෂයයන් 7 ක ප්‍රතිපාදන මුදලින් රු.2,826,882 මුදලක් එනම් සියයට 6 සිට සියයට 44 ක් අතර පරාසයක ඉතිරිවීම් තිබුණි. | මුදල් රෙගුලාසි 50හි විධිවිධාන ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. | වියදම් දැරීමේ අවශ්‍යතායක් පැන නොනැගුණු බව. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එලබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව බැරකම් වටිනාකම් හා විගණනය අනුව නිරීක්ෂණය වූ බැරකම් වටිනාකම් සැසදීමේ දී වැය විෂයන් 3කට අදාලව රු.100,031 ක බැරකම් | අදාල බැරකම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා 2019 ජනවාරි 31 දක්වා පැවති බැරකම් පමණක් ඇතුලත් කර ඇති බවට දක්වා ඇති අතර ඊට පසු වාර්තාවූ බැරකම්වලට අදාල වවුචර්පත් නිසා මෙම |

| | | |
|---|---|---|
| වැඩියෙන් ද වැය විෂයන් 3කට අදාලව රු.76,790 ක බැරකම් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | තත්වය ඇති වී ඇති බව. |

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 13 ක් සහ දෙපාර්තමේන්තු 04 ක් විසින් ලබා දුන් ප්‍රතිපාදන පිළිවෙලින් රු.137,205,331 ක් හා රු.15,311,755 ක් ඌන උපයෝජනය වී තිබුණු අතර එය සියයට 06 සිට සියයට 64 ක පරාසයක තිබුණි. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලබා දුන් ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. | රජයේ ප්‍රතිපත්ති අනුව ව්‍යාපෘති අවලංගු කිරීම නිසා මෙම තත්වය ඇති වී ඇති බව. |

2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)මුදල් රෙගුලාසි 371 (2) (ආ) හි විධි විධාන ප්‍රකාරව තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කල හැක්කේ මාණ්ඩලික නිලධාරීන් වෙත පමණක් වන නමුදු කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම විධිවිධානවලට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 55 දෙනෙකුට අවස්ථා 148 කදී රු.2,139,830 ක මුදලක් තත් කාර්යය අතුරු අග්‍රිම ලෙස නිකුත් කර තිබුණු අතර එය 2018 වර්ෂයේ නිකුත් කල මුළු අතුරු අග්‍රිම මුදලින් සියයට 73 ක් විය. | මාණ්ඩලික නිලධාරීන් වෙත පමණක් අතුරු අග්‍රිම නිකුත් කිරීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී මාණ්ඩලික නිලධාරීන්හට පමණක් අතුරු අග්‍රිම නිකුත් කිරීමට කටයුතු කරන බව. |
| (ආ) මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව නිකුත් කරන ලද තත් කාර්යය අතුරු අග්‍රිමයක් අදාල කාර්යය නිම කර දින | ලබාගත් අතුරු අග්‍රිම කාර්ය නිමකල විගස පියවිය යුතු වේ. | දින 14 ක් ඇතුලත පියවන ලෙස අදාල නිලධාරීන්ට දැනුම් දී ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | 10 ක් ඇතුලත පියවිය යුතුව වුවත් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අවස්ථා 121 කදී රු.2,211,365 ක්වූ තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණු අතර එම අග්‍රිම දින 10 ක සිට දින 212 ක් දක්වා පරාසයක කාල සීමාවකින් පසුව ආපසු පියවා තිබුණි. එමෙන්ම 2018 වර්ෂයේ නිකුත් කල මුළු අතුරු අග්‍රිම වටිනාකම වන රු.2,915,780 න් රු.2,220,365 ක් එනම් සියයට 76 පමණ නියමිත දිනයට පියවා නොතිබුණි. | | |
| (ඇ) | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතුරු අග්‍රිම ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණු බවට නිරීක්ෂණය විය. | අතුරු අග්‍රිම ලේඛනය විධිමත්ව පවත්වා ගත යුතු වේ. | අවශ්‍ය තොරතුරු ඇතුලත් කරමින් අග්‍රිම ලේඛනය විධිමත්ව පිලියෙල කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇති බව. |
| (ඈ) | අතුරු අග්‍රිම ලබාගෙන ඇති නිලධාරියකු ලබා ගත් අතුරු අග්‍රිමය පියවීම අදාල කාලසීමාව තුල සිදුකර නොතිබියදී එම නිලධාරියාටම නැවතවරක් අග්‍රිම නිකුත් කර තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය. | ලබාගත් අතුරු අග්‍රිම පියවා නොතිබියදී නැවත අතුරු අග්‍රිම නිකුත් නොකල යුතුය. | අතුරු අග්‍රිමය පියවූ පසු නැවත අතුරු අග්‍රිම නිකුත් කරන ලෙස විෂය භාර නිලධාරීට උපදෙස් ලබා දුන්බව. |
| (ඉ) | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් විශේෂිත වැඩ වායුසමීකරණ, ගිනි, බී. එම්. එස් සඳහා 2018 දෙසැම්බර් 31 දිනට අයකර නොගත් අත්තිකාරම් මුදල රු.23,329,224 ක් විය. මෙම අත්තිකාරම් මුදල ලබා දීමේ දි සුරක්ෂනයක් ලබාගෙන තිබුණු අතර, එම සුරක්ෂණය 2018 ජූලි 07 දක්වා වර්ෂයකට පමණක් වලංගු වන අතර එම සුරක්ෂණයේ වලංගු කාල සීමාව තුල අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන් පියවා | අත්තිකාරම් සුරක්ෂණයේ වලංගු කාල සීමාව තුල අත්තිකාරම් මුදල අයකර ගැනීම හෝ සුරක්ෂණයේ වලංගු කාල සීමාව දීර්ඝ කර ගත යුතුය. | වැඩ වායු සමීකරණ ගිනි, බී.එම්. අත්තිකාරම් බැඳුම්කරය 2019/05/10 දින දක්වා දීර්ඝ කර ගැනීමට ක්‍රියා කර ඇති බවට දක්වා ඇතත්, එයට අදාල අත්තිකාරම් සුරක්ෂණයේ නිවැරදි සහතික කල පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

ගැනීමට හෝ සුරක්ෂණයේ වලංගු කාල සීමාව දීර්ඝ කර නොතිබුණි.

## 2.6 තැන්පතු ශේෂයන්

මූල්‍ය ප්‍රකාශනවලට අදාල තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම් ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ඉඩම් වන්දි ගෙවීම් තැන්පතු හැර අනෙක් තැන්පතු වර්ග 02 කට අදාලව වර්ෂ 02 ක් කල් ඉකුත් වූ තැන්පතු වටිනාකම රු.7,207,674 ක් වූ අතර ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන ප්‍රකාරව නිරවුල් නොවූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව. |

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල හඳුනා නොගත් හර ශේෂ රු. 1,392,796 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වියදම් හඳුනා ගෙන අදාල වැය ශීර්ෂවලට ගිණුම් ගත කල යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. |
| (ආ)කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හඳුනා නොගත් බැර ලෙස පිළිවෙලින් රු.78,370 ක් හා රු.6,875 ගැලපුම් කල යුතු ශේෂ ලෙස දක්වා තිබුණි. | හඳුනා නොගත් බැර වටිනාකම් නිරවුල් කර ගැලපුම් සිදු කල යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. |

2.8 හිඟ ණය අය නොවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම 2018 අනුව 2018 දෙසැම්බර් 31 දනට අයවිය යුතු හිග ණය ශේෂයන්ගෙන් 2019 මැයි 31 දිනට වැඩ තහනම් කල නිලධාරින් 12 දෙනෙකුගෙන් රු.1,853,393ක් ද සේවය හැර ගිය නිලධාරින් 06 දෙනෙකුගෙන් රු.337,631ක්ද වශයෙන් රු.2,191,029ක හිග ණය ශේෂයන් අය නොවී පවතී. එම ණය ශේෂයන් වර්ෂ 05ඉක්ම වූ හිග ණය ශේෂයන් වේ. | මෙම හිග ණය ශේෂයන් අය කර ගැනීමට නොපමාව කටයුතු කල යුතු වේ. | මෙම හිග ණය ශේෂයන් අය කර ගැනීමට නීතිපති විමසා අදාල ක්‍රියාමාර්ගයන් ගනිමින් පවතින බව. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලසුම් කිරීම

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කර තිබුණි. සැලැස්මේ පහත සඳහන් අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කල ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කලයුතු බවට දන්වා ඇති විස්තර ඇතුලත් කල යුතුවේ. | ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොමැති විස්තර සියල්ල ඇතුලත් කිරීමට සටහන් කර ගත් බව. |
| (ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9ක් සඳහා ඉදිරිපත්කර තිබූ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් | ඉදිරි වර්ෂවලදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර |

| | | |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුලත් කර නොතිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3ක් සඳහා ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කල ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුලත් කර නොතිබුණි. | කලයුතු බවට දන්වා ඇති විස්තර ඇතුලත් කල යුතුවේ. | නොමැති විස්තර සියල්ල ඇතුලත් කිරීමට සටහන් කර ගත් බව. |
| (ඇ) මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘති සංඛ්‍යාව දක්වා නොමැති අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාපටිපාටිය පමණක් දක්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කලයුතු බවට දක්වා ඇති විස්තර ඇතුලත් කල යුතුවේ. | ඉදිරි වර්ෂවලදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොමැති විස්තර සියල්ල ඇතුලත් කිරීමට සටහන් කර ගත් බව. |
| (ඈ)හෝමාගම, දෙහිවල සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාලරාමුව තුල අදාල ක්‍රියාකාරකම් කාර්තුවෙන් කාර්තුවට හෝ මාසිකව කොපමණ ප්‍රමාණයකින් අවසන් කරන්නේද යන්න පැහැදිලිව සඳහන්කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කලයුතු බවට දක්වා ඇති විස්තර ඇතුලත් කල යුතුවේ. | ඉදිරි වර්ෂවලදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොමැති විස්තර සියල්ල ඇතුලත් කිරීමට සටහන් කර ගත් බව. |

3.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ කොළඹ හා මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් රු.300,000 ක් හා රු.200,000 ක් ලෙස ඇස්තමේන්තුගතකල ව්‍යාපෘති දෙකක් 2018 දෙසැම්බර් 31 දිනවන විටත් මූලික වැඩ (ඇස්තමේන්තු අනුමතකල/ ලංසු පිළියෙල කල) පමණක් සිදුකර ඇති අතර එහි භෞතික ප්‍රගතිය සියයට 0 -5 දක්වා විය. | 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු කල ව්‍යාපෘති 2018 දෙසැම්බර් 31 දින වන විට නියමිත පරිදි නිමකල යුතුය. | මේ පිළිබඳව අදහස් දක්වා නොමැත. |
| (ආ)කොළඹ, පාදුක්ක, මහරගම සහ රත්මලාන යන ප්‍රාදේශීයලේකම් කාර්යාලවල රු.1,860,000 ක් ලෙස ඇස්තමේන්තුගත කල ව්‍යාපෘති 8 ක් භෞතික ප්‍රගතිය සියයට 6 සිට සියයට 25 දක්වා ප්‍රමාණයක් විය. | 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු කල ව්‍යාපෘති 2018 දෙසැම්බර් 31 දින වන විට නියමිත පරිදි නිමකල යුතුය. | මේ පිළිබඳව අදහස් දක්වා නොමැත. |
| (ඇ) හෝමාගම, සීතාවක, මහරගම සහ කැස්බෑව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සුබිත පුරවර වැඩසටහන යටතේ ක්‍රියාත්මක කල ව්‍යාපෘතිවලින් රු.7,556,952 ක් ලෙස ඇස්තමේන්තුගත කල ව්‍යාපෘති 16 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පමණක් සිදුකර ඇති අතර එහි ප්‍රගතිය සියයට 6ත් 25ත් අතර විය. | 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු කල ව්‍යාපෘති 2018 දෙසැම්බර් 31 දින වන විට නියමිත පරිදි නිමකල යුතුය. | මේ පිළිබඳව අදහස් දක්වා නොමැත. |
| (ඈ) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ රු.3,840,158 ක් ලෙස ඇස්තමේන්තුකල ව්‍යාපෘතියක් 2018 දෙසැම්බර් 31 දිනවන විටත් ඇස්තමේන්තු අනුමතකර ගැනීම පමණක් සිදුකර | 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු කල ව්‍යාපෘති 2018 දෙසැම්බර් 31 දින වන විට නියමිත පරිදි නිමකල යුතුය. | මේ පිළිබඳව අදහස් දක්වා නොමැත. |

තිබුණි.

### 3.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

-----------------------------------

| | | | |
|---|---|---|---|
| (අ). | හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අදාල කොන්ත්‍රාත්කරු විසින් 2017 දෙසැම්බර් 22 දින නිමකර භාරදිය යුතු වුවත් 2017 දෙසැම්බර් 12 දින වන විටත් එහි භෞතික කාර්යසාධනය සියයට 30ක් පමණක් වී තිබුණි. පසුව අදාල කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව හැර දමා ගොස් තිබු අතර ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් නිම කිරිම සඳහා 2018 වර්ෂයේ රු.මිලියන 180ක ප්‍රතිපාදනද, 2019 වර්ෂයේ රු.මිලියන 188ක ප්‍රතිපාදනද වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර ඇතත් ඒ සඳහා විවෘත ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනිමට අදාල බලධාරින් 2019 ජුනි 06 දින දක්වා කටයුතු කර තිබුණි.<br><br>මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ ගොඩනැගිලි සැලැස්ම 2019 ජුනි 06 දක්වා හෝමාගම ප්‍රාදේශීය සභාව මගින් අනුමත කර නොතිබු අතර එලෙස අනුමත නොකරන ලද ගොඩනැගිලි සැලැස්මක් අනුව අනවසර ඉදිකිරිමක් සිදු කිරීම වෙනුවෙන් හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය සභාව මගින් පනවනු ලබන රු.2,983,000ක සේවා ගාස්තුවකටද යටත් විය හැකි බවට තවදුරටත් නිරීක්ෂණය කරනු ලැබේ. | 2019 වර්ෂය සඳහා රු.මිලියන 188ක ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තුව මගින් වෙන්කර ඇති නිසා අදාල ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමට ක්‍රියාකල යුතුය. | මෙය අමාත්‍යාංශ ලේකම්ගේ අධිකාරි බලය යටතේ ක්‍රියාත්මක වන ප්‍රසම්පාදයක් බැවින් අමාත්‍යාංශයෙන් කරුණු විමසා, ඒ අනුව දිස්ත්‍රික් ඉංජිනේරු විසින් ලබාදෙනු ලබන වාර්තාව අනුව ඉදිරියේදී ප්‍රගතිය වාර්තා කිරිමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්ථාපිත කර ඇති මහල් 6කින් යුතු නව ගොඩනැගිල්ල සඳහා අනුමත සැලැස්ම ප්‍රකාරව මහරගම නගර සභාව විසින් ගොඩනැගිලි සැලැස්ම අනුමත කරවා විදුලි සෝපාන 4 ක් ස්ථාපිත කල යුතු වුවද 2019 පෙබරවාරි 14 දින දක්වා ගොඩනැගිලිවලට විදුලි සෝපාන සවිකර නොතිබුණි. | අදාල විදුලි සෝපාන කඩිනමින් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුවේ. | අවශ්‍යප්‍රතිපාදන සලසාගෙන අදාල විදුලි සෝපාන ඉදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව. |

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 880 හා කොළඹ දිස්ත්‍රික් ලේකම්ගේ 2008 අගෝස්තු 30 දිනැති අංක AE/K/ඇප/2008 දරන චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව කැස්බෑව, රත්මලාන, හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් 09 දෙනෙකු ඇප තැබූ බවට සාක්ෂි නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 හා 2008 අගෝස්තු 30 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල කටයුතු සිදු කිරීමට සටහන් කර ගත් බව. |
| (ආ) මහරගම හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනට සේවයේ නියුක්ත නොවන නිලධාරීන් පිළිවෙලින් 8 හා 6 දෙනෙකුගේ පාස්පොත් ආපසු භාරදීමට 2019 මැයි 14 දින දක්වා කටයුතු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 892 හි විධි විධාන ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවන් සෑම වර්ෂ 3 ක් | සේවයේ නියුක්ත නොවන නිලධාරීන්ගේ පාස්පොත් ආපසු භාරදීමට කටයුතු කල යුතු අතර මුදල් රෙගුලාසි 892 හි විධිවිධාන ප්‍රකාරව අදාල වාර්තා අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව. |

| | | |
|---|---|---|
| අවසානයේ දී අදාල අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද කැස්බෑව හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |

3.5 පාඩු හා හානි

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට අනුව වර්ෂ 5 ට අඩු සහ වර්ෂ 5-10 අතර අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කර නොමැති පාඩු හා හානි වටිනාකම රු.93,383,163 ක් ලෙස දක්වා තිබූ අතර එයින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රථවාහන අනතුරකට අදාල රු.20,000 ක පාඩුව හැර අනෙකුත් පාඩු හා හානි නිරවුල් කිරීම සඳහා 2019 මැයි 27 දින දක්වා කටයුතු කර නොතිබුණි. | වර්ෂ 5ට අඩු හා වර්ෂ 5-10 අතර හානි නිරවුල් කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුය. | අවු.5 අඩු නිරවුල් නොවූ හානි ඉක්මණින් නිරවුල් කිරීමටත් අවුරුදු 5ට වැඩි හානිය වන කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීම් නිසා සිදු වූ පාඩුව කපා හැරීම් සඳහා ඉල්ලා ඇතත් එය කපා හැරීමට නොහැකි බව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇති බව. |

| | | |
|---|---|---|
| (ආ) මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හානි හා පාඩු ලේඛනය පරීක්ෂා කිරීමේ දී මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගින්නෙන් සිදු වූ හානිය රු.503,593 බවට තහවුරු කර ගැනීමට හැකි වූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන හානි හා පාඩු ලේඛනයේ ඉහත හානියේ වටිනාකම රු.629,492 ලෙස පැන්සලයෙන් සටහන් කර තිබුණු බවට නිරීක්ෂණය විය. | අලාභ හානියේ නියම වටිනාකම් අදාල ලේඛනවල හා ගිණුම්වල ඇතුලත් කල යුතු අතර නමුත් මෙය අය කර ගැනීමක් නොව පොතෙන් කපා හැරීමක් නිසා 25% ක් එකතු කල නොහැක. | එම වෙනස ඇති වී ඇත්තේ පරීක්ෂණ මණ්ඩලය විසින් මුදල් රෙගුලාසි 105(1) (ඇ) ප්‍රකාරව අලාභයෙන් 25% එකතු කල නිසා බව. |
| (ඇ) මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හානි හා පාඩු ලේඛනය අනුව 2015 ජනවාරි 30 දින WP.PD. 2679 දරන කැබ්රථය හෝමාගම නගරයේ දී ලොරියක ගැටීම සම්බන්ධයෙන් රු.47,500 ක් වන නිරවුල් වී නොමැති පාඩුව සම්බන්ධයෙන් 2018 වර්ෂයේ විසර්ජන ගිණුමේ දක්වා නොමැති බවට නිරීක්ෂණය විය. | අදාල අලාභ හානිය ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කල යුතුවේ. | 2018 මූල්‍යප්‍රකාශනවලට ඇතුලත් කිරීමට ගිණුම් අංශයට වාර්තා නොවීම නිසා මූල්‍යප්‍රකාශනවල ඇතුලත් නොවූ බව. |

3.6 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීමට ප්‍රථම ප්‍රාදේශීය ලේකම් බල කොට්ඨාශයට ගැනෙන වසම් හා සීමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පලකල යුතු වූවද 1999 මැයි 19 දින ආරම්භ කර ඇති පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා 1999 මාර්තු 03 දින ආරම්භ කරන ලද තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් අදාල සීමාවන් නිර්ණය කොට කොට්ඨාශ ස්ථාපිත කිරීමේ ගැසට් නිවේදන 2019 මැයි 15 දින වන තුරුම ප්‍රකාශයට පත්කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමට ප්‍රථම එම ලේකම් බල කොට්ඨාශවලට ගැනෙන වසම් හා සීමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ එලකල යුතුය. | මේ සඳහා අදාල ඉදිරි කටයුතු සිදු වෙමින් පවතින බව. |
| (ආ) මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර ඇති තක්සේරු වටිනාකම රු.මිලියන 112 ක්වූ ගමනා ගමන මණ්ඩලයට අයිති ඉඩම් සඳහා මෙතෙක් වන්දි ගෙවීමට කටයුතු කර නොතිබුණි. | අදාල ප්‍රතිපාදන ලබාගෙන වන්දි මුදල ගෙවීමට කටයුතු කල යුතුය. | අදාල ඉඩම විධිමත්ව පවරා ගෙන ඇති නමුත් වන්දි ගෙවීම අවසන් වී නොමැති බව. |
| (ඇ) පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ වග දකුණ හා වග නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම්වලට අයත් මිනීමරු රක්ෂිතයේ රජයේ ඉඩම් | එලදාබඳු අයකිරීම් පදනම මත බඳු දී ඇති රක්ෂිතයේ ඉඩම්වල සංවර්ධිතයන් සිදු කර නේවාසික කටයුතු සිදු කරන පාර්ශව සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මේ පිළිබඳ අදාල ඉදිරි කටයුතු සිදුවෙමින් පවතින බව. |

| | | |
|---|---|---|
| ඉතා දීර්ඝකාලයක් තිස්සේ සංවර්ධනය කර භුක්ති විඳින පුද්ගලයන් සඳහා අදාල ඉඩම් කැබිලි සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ගයක් මෙතෙක් ගෙන නොමැති අතර, රක්ෂිතයේ එලදා බදු කරුවන් භුක්ති විඳින කොටස්වල අයිතිය සම්බන්ධව ද තොරතුරු අනාවරණය කර ගෙන නොතිබුණි. ඒ අනුව එලදාබදු අයකිරීම් පදනම මත බදු දී ඇති රක්ෂිතයේ ඉඩම්වල මෙලෙස සංවර්ධනයන් සිදුකර නේවාසික කටයුතු සිදු කරන පාර්ශව පිළිබඳ සැලකිල්ලක් දක්වා කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් පර්චස් 26.5 ක ඉඩම විධිමත් පරිදි රජයට පවරා ගැනීමකින් තොරව රජයේ වියදමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිල්ලේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා දැනට ජනසතු සේවා ක්‍රිකට් සංගමය වෙත දීර්ඝකාලීනව බදු ලබා දී ඇති රත්මලාන ගාලු පාර අංක 511 හි පිහිටි ඉඩමෙන් කොටසක් (පර්.50) ලබා ගැනීමට කටයුතු කරන බවට රත්මලාන ප්‍රාදේශීය | අදාල ඉඩම් පවරා ගැනීමට අදාල කටයුතු කඩිනමින් සිදු කල යුතුවේ. | මේ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. |

ලේකම් විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇති අංක RAT/LAN/09/F1/29 දරන 2017 නොවැම්බර් 17 දිනැති ලිපියෙහි සඳහන් වේ. මෙම ඉඩම පවරා ගැනීම සම්බන්ධව 2017 නොවැම්බර් 17 දිනෙන් පසු විගණන දිනය වන 2019 පෙබරවාරි 13 දින වන විටත්, ඉදිරි කටයුතු කර නොතිබුණි.

4. යහපාලනය
------------

4.1 මහජනයා වෙත සේවය ඉටුවීම
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2010 වර්ෂයේ මාර්තු 23 දින සිට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නව ගොඩනැගිල්ල තුල පවත්වා ගෙන යනු ලබන අතර දැනට 3 වන මහල තෙක් ඉදිකිරීම් නිම වී තිබුණ ද, එම ඉදිකිරීම් සිදු කර වර්ෂ 9 ගත වූවද අනුමත සැලැස්මට අනුව අනෙකුත් මහල් 3 විගණන දිනය වන 2019 පෙබරවාරි 06 දින දක්වා ඉදිකර නොතිබුණි. දැනට මෙම ගොඩනැගිල්ලේ දෙවන මහලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාව ස්ථාපිත කර ඇති අතර වැඩිහිටි හා ආබාධිත පුද්ගලයින් හට එයට පිවිසීම ඉතාමත් අපහසු කාර්යයක් බවට පත්ව ඇත. එමෙන්ම විදුලි සෝපානයක් නොමැති කම නිසා සේවාවන් ලබා ගැනීමට ප්රාදේශීය ලේකම් | ගොඩනැගිල්ලේ අනුමත සැලැස්මට අනුව ඉදිකල යුතු ඉතිරි මහල් තුන ඉදිකර, අදාල විදුලි සෝපාන සවිකිරීමට කඩිනමින් කටයුතු කල යුතුවේ | අවශ්‍යප්‍රතිපාදන සලසා ගෙන විදුලි සෝපාන 4 ඉදිකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව. |

| | | |
|---|---|---|
| කාර්යාලය වෙත පැමිණෙන මහජනතාව දැඩි අපහසුතාවයට පත් වන බවට ද නිරීක්ෂණය විය. | | |
| (ආ) මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මහජන දිනයන්හි දී උපැන්න, මරණ හා විවාහ සහතික අනුපිටපත් ලබා ගැනීමට දිගු පෝලිම් දක්නට ලැබෙන අතර ඡායා පිටපත් යන්ත්‍ර නිසි අයුරින් ක්‍රියාත්මක නොවීම නිසා මුදල් ගෙවීමක් සිදු කොට සේවා ලබා ගන්නා මහජනතාවට ගුණාත්මක සේවාවක් ලබා ගැනීමට නොහැකි වී ඇති බවට නිරීක්ෂණය විය. | මුදල් ගෙවීමක් සිදු කර සේවාවන් ලබා ගන්නා මහජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා නිසි අයුරින් ක්‍රියා කල යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පැමිණෙන වැඩ ප්‍රමාණය දිනෙන් දින වැඩි වුවද ඒ ඒ කාර්යයන් සඳහා වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය අනුව කාර්යාල උපකරණ මිලදී ගන්නා බවත් සේවාව සැපයීමට සිටින නිලධාරීන් අවශ්‍යප්‍රමාණයට වඩා අඩුවෙන් සිටීම හේතුවෙන් මෙලෙස මහජනයාට ගුණාත්මක සේවාවක් සැපයීමට අපහසුතා ඇති වන බව. |

5. මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 06 | 03 |
| ii) තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii)ද්වීතියිකමට්ටම | 58 | 47 | 11 |
| iv) ප්‍රාථමික මට්ටම | 19 | 15 | 04 |
| එකතුව | 89 | 70 | 19 |

අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව පුරප්පාඩු සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව සියයට 21 ක් වන අතර එයින් ද්වීතියික මට්ටමේ පුරප්පාඩු සංඛ්‍යාව සියයට 58 ක් බව නිරීක්ෂණය විය.

නිර්දේශය: අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුයි.

ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම: කාර්යාල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට දන්වා ඇතත් නිලධාරීන් ලබා නොදීම නිසා පුරප්පාඩු පවතින බව.